පළාත් භාණ්ඩාගාර චක්‍රලේඛ අංක 2011/9

මගේ අංකය:-NCP/CS/PT/B/3/1/10,
ප්‍රධාන ලේකම් කාර්යාලය,
උතුරු මැද පළාත,
අනුරාධපුර.
2011 මාර්තු මස 07 දින

සියලුම ලේකම්වරුන්,

නියෝජ්‍ය ප්‍රධාන ලේකම්වරුන්,

දෙපාර්තමේන්තු ප්‍රධානීන් සහ

සියලුම ව්‍යවස්ථාපිත මණ්ඩලවල ප්‍රධානීන් වෙත

## අමාත්‍ය මණ්ඩලය විසින් පත් කරන ලද ප්‍රසම්පාදන කමිටුව

පළාත් මූල්‍ය රීති සංග්‍රහයේ 423.1 වගන්තිය මගින් පළාත් අමාත්‍ය මණ්ඩලය විසින් පත් කරනු ලබන ප්‍රසම්පාදන කමිටුවේ සංයුතිය පිළිබඳ විධිවිධාන පනවා ඇත.

02. යථෝක්ත විධිවිධානයට අනුව 2011 මුදල් වර්ෂයට බලපාන පරිදි පහත සඳහන් නිලධාරීන් එම කමිටුවේ සාමාජිකයින් වශයෙන් උතුරු මැද පළාත් අමාත්‍ය මණ්ඩලය විසින් පත් කර ඇත.

1. ප්‍රධාන ලේකම් - සභාපති
2. අදාළ අමාත්‍යාංශයේ ලේකම් - සාමාජික
3. නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (මුදල්) - සාමාජික
4. නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු) - සාමාජික
5. අදාළ දෙපාර්තමේන්තු ප්‍රධානියා - සාමාජික

03. ඉහත සාමාජිකයින් අතුරින් අදාළ අමාත්‍යාංශ ලේකම් යන්නට ප්‍රසම්පාදන කාර්යය අදාළවන අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තුව අයත්වන අමාත්‍යාංශයේ ලේකම්වරයා සහ අමාත්‍යාංශයක් යටතට නොවැටෙන ලේකම් කාර්යාලවල ලේකම්වරුන් අදහස්වේ. දෙපාර්තමේන්තු ප්‍රධානීන් යන්නට ප්‍රසම්පාදන කාර්යය අදාළ දෙපාර්තමේන්තු / ව්‍යවස්ථාපිත මණ්ඩල ප්‍රධානියා අදහස්වේ.

04. ප්‍රසම්පාදන කමිටුවල සාමාජිකයින්ගේ වගකීම සහ කාර්යභාරය පිළිබඳව ජාතික ප්‍රසම්පාදන නියෝජ්‍යායතනය විසින් නිකුත් කර ඇති "ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය - 2006 භාණ්ඩ හා සේවා" හි 2.4 සහ 2.5 වගන්තිවල දක්වා ඇති අතර, ප්‍රසම්පාදන කමිටුවේ සියලුම සාමාජිකයින් විසින් එම විධිවිධාන වලට අනුකූලව කටයුතු කළ යුතුවේ.

05. අමාත්‍ය මණ්ඩලය විසින් පත් කරන ලද ප්‍රසම්පාදන මණ්ඩලයේ සම්බන්ධිකරණ කටයුතු මා විසින් කරනු ලබන අතර, කමිටු රැස්වීම් පිළිබඳව මාගේ පුද්ගලික සහකාර විසින් අදාළ සාමාජිකයින් දැනුවත් කරනු ඇත. එම දැනුවත් කිරීමට අනුව තීරණය කර ඇති පරිදි ප්‍රසම්පාදන කමිටු රැස්වීම් වලට සහභාගිවීම සඳහා ප්‍රමුඛත්වය ලබා දී කටයුතු කිරීම සියලුම සාමාජිකයින්ගේ වගකීමක් බව විශේෂයෙන් සඳහන් කරමි. එබැවින් මෙම කමිටුවේ සියලුම සාමාජිකයින් විසින් මෙම විධිවිධානවලට අනුකූලව කටයුතු කරන මෙන් දන්වා සිටිමි.

ඒ.තලාකොටුනගේ,
ප්‍රධාන ලේකම්,
උතුරු මැද පළාත.